ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2020/2021
අවසාන පරීක්ෂණය - 2022
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම - SNP8335/ESP2135
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2022.09.04 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. සමාජානුයෝජනය යනු ජීවිත කාලය පුරාම සිදුවන ක්‍රියාවලියකි. උදාහරණ ආශ්‍රයෙන් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. සංස්කෘතිය සහ උප සංස්කෘතිය අතර ඇති වෙනස්කම් මොනවා ද? හේතු පහක් (05) සඳහන් කරන්න.

03. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමුන් සඳහා ප්‍රාථමික සමාජානුයෝජනයේ සහ ද්විතියික සමාජානුයෝජනයේ බලපෑම් සාකච්ඡා කරන්න.

04. සමාජානුයෝජනයේ කාරක පහක් (05) සඳහන් කරන්න.

05. සමවයසකයින් විසින් කෙරෙන උපකාරක ඉගැන්වීම උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

06. ප්‍රතිමාන (Norms) යන සංකල්පය ඔබේ වචනවලින් නිර්වචනය කරන්න.

07. බ්‍රිතාන්‍ය පවුල් අධ්‍යයනය කරමින් රැපෝට් සහ රැපෝට් Rapport and Rapport (1982) විසින් හඳුනාගත් පවුල් විවිධත්වයේ වර්ග පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. දරුවන් හදාවඩා ගැනීමේ ක්‍රම හතරක් (04) සඳහන් කර, ඉන් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් හදාවඩා ගැනීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. "ළමයින් විධිමත් පාසලට ඇතුල්වන කාලය වන විට සම වයස් කණ්ඩායම් සමාජානුයෝජනය වඩාත් වැදගත් වේ."

(i) සම වයස් කණ්ඩායම් තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ඉහත දක්වා ඇති ප්‍රකාශය සඳහා ධනාත්මක සහ ඍණාත්මක අදහස් දෙකක් (02) සහිතව තර්ක ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(iii) සම වයස් කණ්ඩායම් සහ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සමඟ අන්තර්ක්‍රියා කිරීමේ දී ඇති වන බලපෑම් පරීක්ෂා කරන්න. (ලකුණු 09)

10. කාලයත් සමඟ බොහෝ සමාජවල, සාමාන්‍යයෙන් පවුල් ව්‍යුහය විස්තීර්ණ තත්ත්වයෙන් න්‍යෂ්ටික තත්ත්වයට මාරුවීමක් සිදුව ඇත. (Goode, 1963)

(i) වත්මන් ශ්‍රී ලංකාවේ ඉහත වෙනසට දායක වී ඇති සාධක මොනවා ද? සාධක පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති දරුවන් එක් අයෙක් හෝ වැඩි ගණනක් යුක්ත පවුලක සමාජානුයෝජනය විශාල අභියෝගයක් බවට පත් වේ.

ඉහත ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

(iii) ඉහත සඳහන් අභියෝග ජය ගන්නේ කෙසේද ? ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 07)

11. සෑම ආකාරයේම මානව සමාජ තුළ අසමානතා පවතී. මෙම අසමානතා හැඳින්වීමට සමාජ විද්‍යාඥයෝ 'සමාජ ස්ථරායනය' යන යෙදුම භාවිත කරති.

(i) මූලික සමාජ ස්ථරායන පද්ධති හතරක් (04) ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

(ii) සමාජ සංචලතාව යන සංකල්පය සුදුසු උදාහරණ සහිතව නිර්වචනය කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ සමාජ පංතියට අදාළව මතුවෙමින් පවතින අධ්‍යාපනික ගැටලු පරීක්ෂා කරන්න. (ලකුණු 08)

12. දරුවන්ගේ සමාජ හා චිත්තවේගීය සංවර්ධනය සඳහා සම වයසේ මිතුරන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බැවින් සමාජමිතික තත්ත්වය වැදගත් වේ.

(i) සමාජමිතික තත්ත්ව කණ්ඩායම් පහක් (05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(ii) ගුරුවරුන් වශයෙන් ඔබේ පන්ති කාමරයේ දී මතභේදාත්මක ළමයින් හමු වූ විට ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගත යුතු උපාය මාර්ග මොනවා ද? (ලකුණු 07)

(iii) ප්‍රධාන සම වයස් ඉගෙනුම් වර්ග තුන (03) නම් කර විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති දරුවන්ට සම වයස් ඉගෙනුම වාසිදායක වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. සමාජානුයෝජන සන්දර්භ විෂයපථය හා කාලසීමා වශයෙන් වෙනස් වේ.

(i) සමාජානුයෝජනය පද්ධතිය සංවර්ධනය සහ ප්‍රති සමායෝජන පද්ධති අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) සමාජානුයෝජනය නොවූ දරුවන්ගේ ලක්ෂණ සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත දරුවන් සමාජගත කිරීමේ දී සැඟවුණු විෂය මාලාව බලපාන ආකාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

14. ජනමාධ්‍ය බලවත් සමාජානුයෝජන කාරකයක් ලෙස සැලකේ.

(i) විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති දරුවන්ට ජනමාධ්‍ය මගින් ඇති කරන ධනාත්මක සහ ඍණාත්මක බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) මාධ්‍ය සාක්ෂරතාව සහ මාධ්‍ය අධ්‍යාපනය භාවිතා කිරීමේ දී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට ඇති වන අභියෝග මොනවාද? (ලකුණු 08)

(iii) විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා ඇති දරුවන්ගේ සංස්කෘතික සංවර්ධනය සඳහා ජනමාධ්‍ය භාවිත කිරීමේ ක්‍රම යෝජනා කරන්න. (ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.